# ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමයන් විදහා දක්වන නෝට්ටු කාණ්ඩයට ඇතුළත් කර ඇති ආරක්ෂණ සලකුණු

එච්.පී.එම්.ආර්.සී. පතිරාජ

තෙ වැනි වසර, පුරාවිද්‍යා ශාස්ත්‍රවේදී (විශේෂ)

පුරාවිද්‍යා හා උරුම කළමනාකරණ අධ්‍යයනාංශය

chathurikaroshani94@gmail.com

## මිල මුදල්හි ආරම්භය හා විකාශනය

ආර්ථික විද්‍යාඥයින්ට අනුව මිල මුදල්වල ආරම්භය මානවයා අතර හුවමාරුව ආරම්භ වීමත් සමග සිදු වූ බව පිළිගැනීමයි. ප්‍රාථමික මිනිසා ක්‍රමයෙන් ශිෂ්ටවත් ම සිය දෛනික අවශ්‍යතාවයන් පිරිමසා ගැනීම උදෙසා ඔවුනොවුන් අතර හුවමාරුව සිදුවිය. මෙය යුග කීපයක් ඔස්සේ විමර්ෂණයට බඳුන් කල හැකි ය. ප්‍රථමයෙන් ම එළඹෙන වනචාරී යුගයේ දී ආයුධ හා සම් වර්ග ද සංචාරී යුගයේදී ගව, එළු, බැටලු, අශ්ව ආදී සතුන් ද කෘෂිකාර්මික යුගයේ දී ධාන්‍ය හා ලෝම වර්ග ද වටිනාකම් ඒකක ලෙස සිය භාණ්ඩ හුවමාරු කර ගැනීමේ දී භාවිත කළේ ය. භාණ්ඩ හුවමාරුවේ ඇති දුර්වලතා හේතු කොටගෙන මිනිසා විනිමය මාධ්‍යයන් භාවිතයට පෙළඹිණි.

ඉහත කරුණු සැලකිල්ලට ගැනීමේ දී වැටහෙන කරුණක් වනුයේ ලෝකයේ මිල මුදල්වල ආරම්භය සිදු වූයේ භාණ්ඩ හුවමාරුවෙහි ක්‍රමික විකාශනයක ප්‍රතිඵලයක් වශයෙනි. ලංකාවේ ද මිල මුදල්වල ආරම්භයට ඉහත සාධනීය කරුණු බලපාන්නට ඇත. එකල පැවති භාණ්ඩ හුවමාරුව ආකාර තුනක් යටතේ ක්‍රියාත්මක විය.

1 නිහඬ හුවමාරුව (Silent Trade)


2 ත්‍යාග හුවමාරුව (Gift Exchange)

3 සාමාන්‍ය භාණ්ඩ හුවමාරුව (Normal Bata System)

ජන සමාජයේ ඇති වී තිබූ ජන ජෙඛනයේ ප්‍රසාරණය සමාජ ආයෝජනය වර්ධනය වීම හා නිෂ්පාදිත ඉල්ලුම බහුල වීම, මෙන් ම විශේෂ ප්‍රාගුණ්‍යතා ඇති ශිල්ප ශ්‍රේණිවල සම්භවය සමඟ ගනුදෙනු ක්‍රියාවලිය තුල අනුගමනය කරන ලද හුවමාරුවේ ගැටළු මතුවීම යන හේතු මූලික කොටගෙන භාණ්ඩ හුවමාරුව බිඳ වැටුණි. අනතුරුව මිනිසා කාසි භාවිතයට පෙළඹිණි. මෙලෙස ලෝහ කාසි භාවිතයේ ආරම්භය සිදු විය.

විවිධ ලෝහ වර්ග භාතයෙන් කාසි නිෂ්පාදනය වූ අතර ලංකාවේ නිෂ්පාදිත මුල් ම කාසිය වන්නේ හස් එබූ කාසියයි. එය ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ක්‍රිස්තු වර්ෂ මැද භාගය දක්වා ම පරිහරණය විය. අනතුරු ව ස්වස්ථීක කාසි (ගස සහ ස්වස්ථීක, ඇතා හා ස්වස්ථීක, අශ්වයා හා ස්වස්ථීක, සිංහයා සහ ස්වස්ථීක) ලක්ෂමී කාසි, සිංහ කාසි, වෘෂභ කාසි, රන් කහවනු ආදී කාසි බොහෝමයක් නිෂ්පාදනය විය. මේ අතර විදේශීය කාසි ද මෙරට සංසරණයට එක්විය. ඒ අතර සොළී, පාණ්ඩ්‍යය, පෘතුග්‍රීසි, ලන්දේසි, ඉංග්‍රීසි ආදී බටහිර රටවල් ද ප්‍රධාන ය.

ලෝහ කාසි භාවිතය මෙලෙස පැවති නමුත් එය කලක් ගතවන විට කාසි වෙනුවට මුදල් නෝට්ටු අච්චු ගසා පරිහරණය කරන්නට විය. මුදල් නෝට්ටුවල ආරම්භය පහත පරිදි විමර්ෂනයට ලක් කළ හැකි ය. මෙරට ලන්දේසි පාලනය පැවති සමයෙහි ඇමරිකානු යුද්ධය නිසා 1780 සිට මෙරට සතුරන්ගෙන් ආරක්ෂා කර ගැනීම උදෙසා යුධ භටයන් නඩත්තු කිරීමට විශාල මුදලක් වියදම් වීමෙන් 1785 දී මෙරට ආදායම වියදමට ප්‍රමාන නොවූ හෙයින් භාණ්ඩාගාරය හිස් විය. එයට පිළියමක් ලෙස එවකට ඕලන්ද ආණ්ඩුකාරවරයා වූ වැන් ද ග්‍රාප් විසින් (1785 - 1790) පළමුවරට මුදල් නෝට්ටු භාවිතය ආරම්භ කරන ලදි. පතාග 25000ක් වටිනා මුදල් නෝට්ටු පළමුවරට අච්චු ගැසීමට 1785 මාර්තු 19 වන දින සම්මත විය. ඒ අනුව ඒවා පතාග 50, 100, 500 ආදී නෝට්ටු වූ අතර පතාග 1, 2, 3, 4, 5, 10 නෝට්ටු ද පසුව අච්චු ගසන ලදී. එම පතාග නෝට්ටුවෙහි සිංහලෙන් "පතාග එකකට හොඳයි" යන්න ඕලන්ද හා දෙමළ භාෂාවෙන් ද සඳහන් කර ඇත. අනෙක් පැත්තෙහි නෝට්ටු අංකය නිකුත් කල දිනය සහ එම මුදල දක්වා ඇත.




1. ඕලන්ද රජය විසින් හඳුන්වා දුන් පතාග නෝට්ටුවකි.

පසුකාලීන ව ලංකාවේ මේ සමය වන විට බ්‍රිතාන්‍ය යටත් විජිත යුගයේ පුද්ගලික බැංකු විවෘත විය. කඩදාසි මුදල් නෝට්ටු නිකුත් කිරීමේ බලය එම බැංකුවලට ද හිමි වූ අතර විලියම් නොම්ජසන් නම් පුද්ගලයා 1841 ජූනි 13 වන දින ලංකා බැංකුව නම් ප්‍රථම වාණිජ බැංකුව විවෘත කර තිබුණි. 1843 වන විට එම බැංකුව හා ඒකාබද්ධ වූ ඔරියන්ටල් කෝපරේෂන් ආයතනයත් 1844 අංක 23 ආඥා පනත අනුව මුදල් නිකුත් කිරීමේ කාර්ය අරඹන ලදී. එම වරප්‍රසාදය ලත් වෙනත් බැංකු වූයේ බාටඩ් මර්කන්ටයිල් බෑන්ක් ඔෆ් ඉන්දියා හා ලන්ඩන් ඇන්ඩ් චයිනා නම් බැංකුවයි. කෙසේ වුව ද මුදල් නෝට්ටු 1850 දී භාවිතයෙන් ඉවත් කෙරිණි. එය සිදු කරන ලද්දේ ශ්‍රීමත් හෙන්රි වෝඩ් ආණ්ඩුකාරවරයාගේ නියෝගයක් මත ය. එමෙන් ම බැංකු මගින් නිකුත් කරන ලද මුදල් නෝට්ටු සියල්ල ම කච්චේරි විසින් ද භාරගත යුතු ය. බ්‍රිතාන්‍ය පාලන යුගයේ මුල් පාලනය පිළිබඳ ව අවධානය යොමු කරන විට වැදගත් වන්නේ 1884 මැයි 03 වන දින ඔරියන්ටල් බැංකුව වසා දැමීම ය. එදින දිවයිනේ පාලන

කටයුතු අවුල් තත්ත්වයකට පත් වූ අතර බංකොලොත් වූ බැංකු විසින් නිකුත් කර තිබූ මුදල් නෝට්ටුවල වලංගුභාවය පාලකයන් සහතික කර සිටියේ ය. මුදල් නෝට්ටු නිකුත් කිරීම පිළිබඳ ව ගැටළු උද්ගත වූ බැවින් එහි බලතල රජය මත ම පැවතිය යුතු ය යන්න ආණ්ඩුකාරවරයාගේ මතය වූ අතර ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ මතය ද එය ම විය. මේ අනුව මුදල් නිකුත් කිරීමේ බලය සහිත කොමසාරිස් මණ්ඩලයක් පත් කෙරිණි. වර්ෂ 1950 දී මුදල් ඇමතිතුමාගේ හා ශ්‍රී ලංකා මහ බැංකු අධිපතිතුමාගේ අත්සන් සහිත ව ශ්‍රී ලංකා මහ බැංකුව මුදල් නෝට්ටු නිකුත් කිරීම ආරම්භ කරන තෙක් මෙරට මුදල් නෝට්ටු නිකුත් කිරීමේ වරම හිමි වී තිබුණේ කලින් සඳහන් කරන ලද මණ්ඩලයට ය. ඒ අනුව 1885 දී මුදල් නෝට්ටු අතර රුපියල් පහ, දහය, පනහ, සහ සියය ද 1899 දී රුපියල් දහයේ නෝට්ටු කොළය ද නිකුත් විය. 1917 රුපියල සහ රුපියල් දෙක නෝට්ටු කොළ ද




2. 1979 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රුපියල් දෙකේ නෝට්ටුව




3. 1962 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රුපියලේ නෝට්ටුව



4. 1965 දී ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන රුපියල් සියය නෝට්ටුව.




5. 1970 දී ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන රුපියල් පනහේ නෝට්ටුව.

පසුකාලීන ව 1923- 1927- 1930 අතර කාලයේ දී රුපියලේ කොළ විසි පහකින් ද රුපියල් දෙකේ කොළ විසි පහකින් ද රුපියල් පහේ කොළ විස්සකින් ද යුත් නෝට්ටු කොළ පොත් නිකුත් විය. එමෙන් ම පැවති ලෝහ හිඟය නිසාවෙන් 1941- 1942 ශත පනහ හා ශත විසිපහ, ශත පහ හා ශත දහය ද නෝට්ටු ලෙස භාවිතයට එක්විය. මේ අනුව ශත පහක නෝට්ටුව දෙකට කඩා ශත තුන හා ශත පහ වශයෙන් ද භාවිත කිරීමට හැකිවන

පරිදි සකස් කර තිබුණි. දැනට අප අතර ඇතැම් වයස් ගත පුද්ගලයන් මේ මුදල් නෝට්ටු පොත් පිළිබඳ ව විවිධ මත පල කරති.

## අධ්‍යයන අරමුණු

එසේ ආරම්භ වූ ලක්දිව මුදල් භාවිතය කාලාන්තරයක් තිස්සේ වැඩි දියුණු වෙමින් අද අප භාවිතා කරන ක්‍රමවත් මුදල් නෝට්ටු බවට පත් වී ඇත. මෙම අධ්‍යයනයෙන් අරමුණු කෙරෙන්නේ ප්‍රථමයෙන් ම ශ්‍රී ලංකාවේ දැනට භාවිත කෙරෙන මුදල් නෝට්ටු සඳහා භාවිත කර ඇති ආරක්ෂණ ක්‍රම පිළිබඳ ව සුළු හෝ දැනුමක් ලබා දීමත් එම ආරක්ෂණ ක්‍රම සම්බන්ධ ව දැනුවත් වීම සඳහාත් ය. එමෙන් ම ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම සඳහා ද මෙය මනා පිටිවහලක් වෙතැයි අපේක්ෂා කෙරේ. යම්කිසි ආයතනයක් හෝ පුද්ගලයෙක් විසින් මහ බැංකුව විසින් නිකුත් කරන ලද මුදල් නෝට්ටු අනුකරණය කරමින් මුදල් නෝට්ටු නිකුත් කිරීම මෙයින් වැළකී යාම ද සිදුවේ.

## අධ්‍යයන ක්‍රමවේද

මෙම අධ්‍යයනය සඳහා මූලික වශයෙන් යොදා ගනු ලැබුවේ පුස්තකාල ගවේෂණයයි. මූලාශ්‍ර අධ්‍යයනය තුළින් මෙම පත්‍රිකාව සකස් කිරීමට දත්ත සපයා ගන්නා ලදි.

## හැඳින්වීම

ලොව මුදල් භාවිතය ඇරඹූ දා සිට ම ඒවායේ අනුකරණ හොරට නිෂ්පාදනය කොට සංසරණයට මුදාහැර තිබේ. එය කාසි හා මුදල් නෝට්ටු භාවිතය ඇරඹීමට පෙර භාණ්ඩ හුවමාරු ආර්ථික අවධියේ පටන් ම පැවත තිබේ. අද අප "ව්‍යාජ මුදල්" ලෙස හඳුන්වනු ලබන්නේ මේවා ය. මෙම උවදුර පිටු දැකීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගෙන ඇති ක්‍රියා මාර්ගයන් ද රැසකි. ඉන් එක් පියවරක් වූයේ මුදල් නිකුත් කිරීමේ ආධිපත්‍ය තහවුරු කිරීම ය. එම ආධිපත්‍යට එරෙහි ව යමින් ව්‍යාජ මුදල් නිකුත් කළ අයට මරණ දඬුවම පවා නියම කළ අවස්ථා ලොව විවිධ රටවලින් වාර්තා වේ. කෙසේ වෙතත් කවරාකාර දඬුවමකින් වුවත් ව්‍යාජ මුදල් නිෂ්පාදනය මුළුමනින් ම වැළැක්වීම ඉතාමත් ම අපහසු කටයුත්තක් වේ. ඒ අනුව එයට නිසියාකාර පිළියමක් ලෙස තාක්ෂණික උපක්‍රම වැඩි දියුණු කිරීමට මූල්‍ය බලධාරීන් පියවර ගෙන ඇත්තේ ඒ හේතුවෙනි. ඒ අනුව මේ වන විට ව්‍යාජ මුදල් නිපදවන්නන්ට අනුකරණය කළ නොහැකි තාක්ෂණික ක්‍රම මුදල් නෝට්ටු නිෂ්පාදනයේ දී භාවිතයට ගනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් වරින් වර නව මුදල් නෝට්ටු කාණ්ඩ හඳුන්වාදෙන අතර ම ව්‍යාජ මුදල් නෝට්ටු නිෂ්පාදනය වැළැක්වීමේ පියවර ලෙස නෝට්ටු සඳහා විවිධ ආරක්ෂණ සලකුණු රැසක් ද හඳුන්වා දී තිබේ. මෙම ආරක්ෂණ සලකුණු යෙදීම දෙයාකාරයකින් සිදු කර ඇත. ඇතැම් ආරක්ෂණ සලකුණු යොදන්නේ නෝට්ටු සඳහා කඩදාසි නිෂ්පාදනය කරන අවස්ථාවේ දීම ය. අනෙක් ආරක්ෂණ සලකුණු යොදන්නේ නෝට්ටු මුද්‍රණයේ දීම ය. ඒ අනුව ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමයන් දැක්වෙන මුදල් නෝට්ටු කාණ්ඩයට ඇතුලත් කර ඇති ආරක්ෂණ සලකුණු පහත පරිදි විමර්ශනයට ලක් කළ හැකි ය.

### A. මුද්‍රණ කඩදාසිය

සැබෑ මුදල් නෝට්ටුවක කඩදාසිය මෘදු ය, සිනිඳු ය දිලිසෙන හෝ ඉටි ගෑ ස්වභාවයෙන් තොර ය . එය ස්පර්ෂ කර බැලීමේ දී තීන්ත ඝනව මුද්‍රණය කර ඇති ස්ථාන ඉහළට ඉස්මතු වූ සලකුණු ඇඟිලි තුඩුවලට දැනේ. මෙම තාක්ෂණය හඳුන්වනු ලබන්නේ "ඉන්ටැග්ලියෝ " මුද්‍රණය ලෙස ය.

### B. ආරක්ෂණ නූල

රුපියල් 10, 20, 50, 100 නෝට්ටුවල ආරක්ෂණ නූල නිමවා ඇත්තේ කඩදාසියට කාවදින ලෙස ය. එය central bank of Sri Lanka යන්න ඉතා කුඩා අකුරින් මුද්‍රණය කරන ලද පොලියෙස්ටර් නූලකි. රුපියල් 500 සහ 1000 නෝට්ටුවල කඩදාසියට කා වැද්දූ ආරක්ෂණ නූල රිදී පැහැති කඩ ඉරි සේ දැකිය හැකි ය. නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලූවිට මෙම නූල දිස්වන්නේ අඛණ්ඩ සිරස් රේඛාවක් ලෙෂ ය. මෙම ලෝහමය නූල හඳුන්වන්නේ " ස්ටාර් වයිඩ් " නමිනි. රුපියල් 500 නෝට්ටුවේ මිලිමීටර් 3 ක් පළලින් යුතු නූලෙහි ශ්‍රී ලංකාවේ ඩේසි මල් මෝස්තරයක් ද රුපියල් 1000 නෝට්ටුවෙහි මිලිමීටර් 4ක පළලින් යුත් නූලෙහි පසක වියමනකට සමාන රටාවක් ද පැහැදිලි ව දක්නට ලැබේ. 2006 වර්ෂයේ දී නිකුත් කරන ලද රුපියල් 2000 නෝට්ටුවෙහි යොදා ඇති ආරක්ෂණ නූල " ස්ටාර් ක්‍රෝම් " ලෙස හඳුන්වන අතර නෝට්ටුව උස් පහත් කර බැලීමේ දී මෙම නූලෙහි වර්ණය දිස්වන්නේ වරෙක තද රතු පාටින් හා වරෙක කොළ පාටින් ය. සමනළ රූපයක් සමඟින් නෝට්ටුවේ වටිනාකම රුපියල් 2000 යන්න නූල දිගේ දැකිය හැකි ය. 2005 වර්ෂයේ නිකුත් කරන ලද රුපියල් 500 නෝට්ටුවෙහි එතෙක් යොදා තිබූ මිලිමීටර් 3ක පළලින් යුත් ස්ටාර් වයිඩ් ආරක්ෂණ නූල වෙනුවට මිලි මීටර් 3ක පළලින් යුක්ත ස්ටාර් ක්‍රෝම් ආරක්ෂණ නූල ද 2006 වර්ෂයේ සිට නිකුත් කරන ලද රුපියල් 1000 නෝට්ටුවේ එතෙක් තිබූ මිලි මීටර් 4ක පළලින් යුත් ස්ටාර් වයිඩ් ආරක්ෂණ නූල වෙනුවට ස්ටාර් ක්‍රෝම් ආරක්ෂණ නූල ද යොදා තිබේ.

### C. දිය සලකුණු

නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලූ විට සිංහයකුගේ සලකුණක් පැහැදිලි ව දැකිය හැකි ය. මෙය ශ්‍රී ලංකාවේ ජාතික කොඩියේ දක්නට ලැබෙන සිංහ රූපයෙහි අනුරුවක් වන අතර අත දරා සිටින කඩුව වෙන් ව ඉස්මතුව පෙනේ.

### D. විනිවිද පෙනෙන සලකුණු

නෝට්ටුව ආලෝකයට යොමු කොට බැලූ විට එහි මුහුණත සහ පිටුපස එකිනෙකට සමපාත වන පරිදි මුද්‍රණය කර ඇති හැඩතල හෝ මෝස්තර දක්නට ලැබේ.

### E. ස්පර්ෂයට දැනෙන ඉරි සලකුණු

රුපියල් 2000 නෝට්ටුවේ වම් සහ දකුණු පස තීරුවල මැදට වන්නට ඉරි රටා යොදා තිබෙන අතර ඒවා ස්පර්ෂයේ දී රළු ස්භාවයෙන් දැනේ. මේ නිසා දෘශ්‍යාබාධිත අයට වුව ද නෝට්ටුව පහසුවෙන් හඳුනාගත හැකි ය.

## F. දිළිසෙන පටිය

නෝට්ටුවේ පිටුපස නෝට්ටුව දිගේ සිරස් අතට ගමන් කරන්නා වූ රන් පැහැති දිළිසෙන පටියක් මුද්‍රණය කර ඇත.




## G. බහු ස්ථර සැඟවුණු සලකුණු

නෝට්ටුව ඇස් මට්ටමින් තිරස් ව ඇලකර බලන විට එහි වටිනාකම සඳහන් සැඟවුණු සංකේතයක් දක්නට ලැබේ. සාමාන්‍යයෙන් මෙම ලක්ෂණය දක්නට ලැබෙන්නේ නෝට්ටුවල පහළ මැද කොටසේ ය.

## H. වර ගැන්වූ කොන්

2005 නොවැම්බර් 19 වැනි දිනෙන් පසු ව නිකුත් කරන ලද රුපියල් 2000 සහ රුපියල් 500 නෝට්ටුවල ද 2006 ජූලි 03 වැනි දින නිකුත් කරන ලද රුපියල් 1000 නෝට්ටුවල ද නෝට්ටුවේ සිව්කොන විකර්ණ රේඛා ලෙසින් දිවෙන විශේෂිත දිය සලකුණක් දැකිය හැකි ය. මෙම සලකුණ හැඳින්වෙන්නේ වර ගැන්වූ කොන් නමිනි.




ඒ අනුව 2011 දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද නව මුදල් නෝට්ටු කාණ්ඩය මගින් මෙම ආරක්ෂණ ක්‍රම තවදුරටත් වැඩි දියුණු කරන ලදී. මෙම ආරක්ෂණ විධි විධානයන්ට අමතර ව නෝට්ටුවෙහි ඉදිරිපස සහ පිටුපස යන දෙපසෙහි ම ශ්‍රී ලංකාවේ පෞරාණික උරුමයන් දක්වා ඇත. මෙතුලින් ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීමට හැකියාව ලැබේ. ඉහත දැක් වූ කරුණුවලට අනුව ලංකාවේ මුදල් නෝට්ටු ව්‍යාජ ව නිකුත් කිරීමට එරෙහි ව යොදා ඇති තාක්ෂණික ක්‍රියා මාර්ගයන් විමර්ෂනයට ලක් කිරීමේ දී පැහැදිලි වන්නේ ව්‍යාජ මුදල් නෝට්ටු පහසුවෙන් හඳුනා ගැනීමට හැකියාව ලැබෙන බව ය.